# ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

## රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය

**(1891 අංක 5 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් ආඥා පනත යටතේ සංස්ථාගතයි)**

මෙම සංගමයේ පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර:

**සුදුසුකම්:**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ IIIවන පන්තියේ නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ IIIවන පන්තියේ නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ I වන පන්තියේ නිලධාරියෙකු හෝ රාජ්‍ය/පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ/සමාන්තර කළමනාකරණ සේවාවක අධි ශ්‍රේණියේ හෝ I වන පන්තියේ නිලධාරියෙකු වීම.

**පළපුරුද්ද:**

ඉහත තනතුර සඳහා ගිණුම් කටයුතු, ආයතන හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද සහ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ ප්‍රවීණත්වයක් තිබීම අවශ්‍ය වේ. දෙමළ භාෂාව පිළිබඳ දැනුම අතිරේක සුදුසුකමක් වේ.

**වැටුප් හා අනෙකුත් වරප්‍රසාද:**

මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුට තමා දැනට ලබන රජයේ වැටුප් පරිමාණයට සමාන වැටුප සහ මාසික ඒකාබද්ධ වැටුපෙන් 50% ක අතිරේක දීමනාවක්, නිත්‍ය තනතුරට හිමි රජයේ අනුමත වෙනත් දීමනා, සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී තීරණය කරනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනා සහ වාර්ෂිකව ඉතිරි කර ගන්නා නිවාඩු වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර හා නිදහස් දුම්රිය ගමන් බලපත් ද හිමි වේ.

**කොන්දේසි:**

ඉහත තනතුර සඳහා රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 12 වන පරිච්ඡේදයේ අංක 148 වගන්තිය ප්‍රකාරව වසර දෙකක සේවා කාලයක් සඳහා රජයේ අවශ්‍යතාවය මත ද්විතීයන පදනම මත මේ සඳහා බඳවා ගනු ලැබේ.

මෙම ආයතනය මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතින සංස්ථාපිත ආයතනයක් බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ II වන පරිශිෂ්ඨය මගින් ඔබගේ අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති අනුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි සංගමයේ සේවය සඳහා වර්ෂ දෙකක කාලයක් ද්විතීයන පදනම යටතේ මුදාහැරිය හැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

තෝරා ගනු ලබන අයදුම්කරු සංගමයේ කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන මුදලක් සංගමයට ඇපයක් ලෙස තැබිය යුතුය.

අයදුම්කරුවන් සිය අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර"** ලෙස සඳහන් කර, සභාපති, රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය, අංක155/5, කාසල් වීදිය, කොළඹ 08 යන ලිපිනයට තම ආයතන ප්‍රධානියා මගින් 2024.08.09 දින ප.ව.2.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු අතර, එහි ප්‍රගමන පිටපතක් රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය වෙත යොමු කරන්නේ නම් වඩාත් පහසු බවද කාරුණිකව දන්වමි.

**රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය,**
**155/5,කාසල් වීදිය,කොළඹ 08.**

**ආචාර්ය.එච්.ඒ.එන්.එස්.කුමාර**
**සභාපති**
**2024.07.14**

**ඊමේල් :** psmpa@sltnet.lk

**වෙබ් :** www.psmpa.com